12

# පැරණි අනුරාධපුරයේ මහා ස්තූප සංරක්ෂණයේ දී වැනිස් ප්‍රකාශ පත්‍ර (The Venice Charter 1964) නිර්දේශවල උපයෝගීතාව

ඩබ්ලිව්.එම්.ටී.බී. විජේපාල

**සංක්ෂේපය**

*යම් රටක පුරාවිද්‍යාත්මක උරුමයේ සුරක්ෂිතකරණය සඳහා ජාතික වශයෙන් වූ නීති අණපනත් මෙන්ම ජාත්‍යන්තර වශයෙන් ඉදිරිපත්කරනු ලබන නිර්දේශයන් ද බෙහෙවින් වැදගත් වේ. 1964 වර්ෂයේ දී ප්‍රකාශයට පත්වන වැනිස් ප්‍රකාශ පත්‍රයේ (The Venice Charter) නිර්දේශ අනුරාධපුරයේ මහා ස්තූප සම්බන්ධ සංරක්ෂණ ක්‍රියාවලියේ දී ක්‍රියාවට නැංවී ඇති ආකාරය පිළිබඳ පශ්චාත් විමර්ශනයක් මෙම ආඛ්‍යානය තුළින් බලාපොරොත්තු වේ. එක් අතකින් මෙරට ලෝක උරුම බිම්කඩක පවත්නා තිශ්වල පුරාවිද්‍යාත්මක සාධක සම්බන්ධයෙන් මෙතෙක් ගෙන ඇති සංරක්ෂණ ක්‍රියාමාර්ගවල වටිනාකම් ගෝලීය තලයේ ලා විමර්ශනය කිරීමක් වශයෙන් ද මෙය පෙන්වා දිය හැකි ය. වෙනිස් ප්‍රඥප්තියේ සමස්ත වගන්ති 16කින් සංරක්ෂණය කිරීම හා ප්‍රතිසංස්කරණය යන ඛාණ්ඩයන්ට අයත් වගන්ති 13ක් පිළිබඳව මෙම පර්යේෂණයේ දී ප්‍රාමාණික අවධානයට පාත්‍රව ඇත.*

මුඛ්‍ය පද: අනුරාධපුරයේ මහා ස්තූප, වැනිස් ප්‍රකාශ පත්‍රය, සංරක්ෂණය, ප්‍රතිසංස්කරණය.

## හැඳින්වීම

පුරාවිද්‍යාත්මක උරුමයේ ආරක්ෂාව හා පැවැත්ම වෙනුවෙන් හිතකර ප්‍රතිපත්තියක් ලෙස යම් රටක රජය විසින් විටින් විට නිකුත් කරන ආඥා පනත් පෙන්වා දිය හැකි ය. මෙලෙස ශ්‍රී ලංකාවට බලපාන ලෙස පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව (1890 දී අරම්භ වූ පුරාවිද්‍යා සමීක්ෂණ දෙපාර්තමේන්තුව) ආරම්භ වීමටත් පෙර සමයේ සිට

වර්තමානය දක්වාම පුරාවිද්‍යා උරුමයේ ආරක්ෂාව වෙනුවෙන් වූ නෛතික ලේඛන ලෙස විවිධ ආඥා පනත් ඉදිරිපත් වී ඇත.

- 1888 අංක 17 දරන පැරණි නිදන්වස්තු ආඥා පනත
- 1891 අංක 03 දරන පැරණි නිදන්වස්තු ආඥා පනත
- 1900 අංක 15 දරන පුරාවස්තු ආඥා පනත
- 1940 අංක 09 දරන පුරාවස්තු ආඥා පනත
- 1955 අංක 2 හා 22 දරන පුරාවස්තු (සංශෝධන) පනත්
- 1988 අංක 73 දරන සංස්කෘතික දේපල පනත
- 1990 අංක 16 දරන ජාතික වැදගත්කමක් ඇති පුරාවිද්‍යා ස්ථාන සම්බන්ධ වූ පනත
- 1998 අංක 24 දරන පුරාවස්තු (සංශෝධන) පනත
- ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජාතික පුරාවිද්‍යා ප්‍රතිපත්තිය - 2006

මේ හැරෙන්නට මෙරට පුරාවිද්‍යා උරුමයේ ආරක්ෂාව වෙනුවෙන් ක්‍රියාත්මක වන්නා වූ සමගාමී ආයතනවලින් ප්‍රකාශයට පත්කරන ලද ආඥා පනත්වල වගන්ති තුළින් ද මෙරට පුරාවිද්‍යා උරුමයේ ආරක්ෂාව වෙනුවෙන් යම් පිටුබලයක් ලැබී ඇත.


- 1941 අංක 31 දරන ජාතික කෞතුකාගාර ආඥා පනත
- 1980 අංක 57 දරන මධ්‍යම සංස්කෘතික අරමුදල පනත
- 1998 අංක 62 දරන සීගිරි උරුම පදනම පනත
- 1994 අංක 7 දරන ගාලු උරුමය පදනම පනත
- 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනත
- 1992 අංක 4 දරන පුරාවිද්‍යාඥයින්ගේ සභාව පනත යනාදිය එහි දී කැපී පෙනෙයි.

දේශීය වශයෙන් මෙසේ ඉදිරිපත්ව ඇති ආඥා පනත්වලට අමතරව විදේශීය වශයෙන් ඉදිරිපත් වන නිර්දේශයන් හෙවත් ප්‍රඥප්තීන් පිළිබඳව ද මෙහි දී සළකා බැලිය යුතු වේ. එහි දී සංස්කෘතික හා ස්වභාවික ලෝක උරුමයන් සම්බන්ධයෙන් වූ සියලු නිර්ණායක ඇතුළත් කරමින් ප්‍රකාශයට පත් කොට ඇති ලෝක උරුම ප්‍රඥප්තිය (*Convention Concerning the Protection of the World Cultural and Natural Heritaage* 1972) ප්‍රකාශ පත්‍රය ද, ඕස්ට්‍රේලියානු සංස්කෘතික වැදගත්කමින් යුතු ස්ථාන සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද බරා ප්‍රඥප්තිය (The Burra Charter) 1979 ද, ඓතිහාසික නගර හා නාගරික ප්‍රදේශවලට අනුකූල වන

පරිදි පෞද්ගලික හා සමාජමය ජීවන රටාවන් වැඩිදියුණු කිරීම පිළිබඳව හා සංස්කෘතික දේපළ ආරක්ෂා කිරීම පිළිබඳව සැළකිල්ල යොමු කරමින් 1987 වර්ෂයේ දී අයිකොමස් සංවිධානයේ මැදිහත් වීමෙන් ප්‍රකාශයට පත් කරන ලද වොෂින්ටන් ප්‍රකාශපත්‍රය (*WASHINGTON CHARTER*, 1987, No.4&ද, පුරාවිද්‍යාත්මක උරුමය ආරක්ෂා කිරීමට, මනාව හැසිරවීමට මෙන්ම වර්තමාන හා අනාගත මානව සංහතිය වෙනුවෙන් ප්‍රයෝජනයට ගැනීමට අදාළ නිර්ණායක සැපයීමේ අරමුණින් ඉදිරිපත් කරන ලද පුරාවිද්‍යා උරුම කළමනාකරණ ප්‍රඥප්තිය හෙවත් 'පුරාවිද්‍යාත්මක උරුම ආරක්ෂා කිරීම හා කළමනාකරණ සඳහා වන ප්‍රකාශ පත්‍රය' (*CHARTER FOR THE PROTECTION AND MANAGEMENT OF THE ARCHAEOLOGICAL HERITAGE - 1990*) ද ගෝලීය වශයෙන් පවත්නා උරුමය ආරක්ෂා කිරීම අභිප්‍රාය කොටගත් ප්‍රඥප්තීන් අතර කැපී පෙනෙයි. තව ද, සංස්කෘතික උරුම ස්ථාන අර්ථකථනය හා ඉදිරිපත් කිරීම සඳහා වන අයිකොමාස් ප්‍රකාශ පත්‍රය (The ICOM§ Charter for the Interpretation and Presentation of Cultural Heritage Sites [2008]),ලෝක උරුම ස්ථාන සඳහා වන කළමනාකරණ සැළසුම් (Management Plans for World Heritage Sites [2008]&, අන්තර්ජාතික සංස්කෘතික සංචරණ ප්‍රඥප්තිය (ICOM§ International Cultural Tourism Charter [1999]), පැරිස් ප්‍රකාශ පත්‍රය (The Paris Declaration [2011])යනා දී ඉහත සියලු ප්‍රකාශ පත්‍රයන්ට පෙර වර්ෂ 1964 දී වැනීසියේ සම්මත කරගන්නා ලද ''ස්මාරක සහ ස්ථාන සංරක්ෂණය කිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වන අන්තර්ජාතික ප්‍රකාශ පත්‍රය'' හෙවත් ''වැනිස් ප්‍රඥප්තිය (*The Venice Charter 1964*)'' පැරණි ස්පර්ශිත නිශ්චල උරුමය ආරක්ෂා කිරීමේ දී සැළකිලිමත් විය යුතු ආකාර පිළිබඳ ජාත්‍යන්තර මට්ටමේ නිර්ණායක පෙළක් ඉදිරිපත් කරන ප්‍රධාන ප්‍රඥප්තියකි.

**පර්යේෂණ ක්‍රමවේදය**

ප්‍රස්තුත මාතෘකානුගත සන්දර්භයෙහි සාකච්ඡාවට බඳුන් වන 'පැරණි අනුරාධපුරය' යන්නෙන් මුල් ආරාමික කාලසීමාවේ හෙවත් ක්‍රි.පූ. දෙවන (2) සියවසේ සිට ක්‍රි.ව. හතරවන (4) සියවස තරම් කාලය දක්වා කාල වකවානුවත්, මහා ස්තූප යන්නෙන් එම කාලසීමාවේදී ම නිර්මාණය වූ මිරිසවැටිය, රුවන්වැලිය, අභයගිරිය හා ජේතවනය යන ස්තූප හතරත් (සිතියම 1) නියෝජනය වෙයි. මෙම දැවැන්ත නිර්මාණයන් සඳහා 'මහා ස්තූප' යන නාමය භාවිත කිරීම සම්බන්ධයෙන් ද පැහැදිලි කළ යුතුව ඇත. මෙසේ මහා ස්තූප යන්නෙන් අදහස් කරන ලද්දේ ප්‍රමාණයෙන් විශාල වූ ස්තූපය යන්නයි. 'විශාල' යන්න සාපේක්ෂ නිර්ණයක් වන නමුත් මහාවංසය පෙරටු කොට ගත් මූලාශ්‍රයන් හි අනුරාධපුරයේ මහා ස්තූපයන්ට සිදු කරන ලද පූජාවන්, සංග්‍රහයන් මෙන්ම පැවැත්ම සම්බන්ධයෙන් වූ මැදිහත් වීම්




සිතියම 1 අනුරාධපුර මහා ස්තූපවල පිහිටීම දැක්වෙන විස්තරාත්මක සිතියම

පිළිබඳ පෙන්වා දීමේ දී 'මහා සෑ' යන නාමය භාවිත කරඇති බැවින් ප්‍රස්තුත මාතෘකාවේ දී ද මහා ස්තූප යන නාමය භාවිත විය. 'සංරක්ෂණය' නම් යම් ස්මාරකයක් හෝ වස්තුවක් සම්බන්ධයෙන් එහි ආයු කාලය දීර්ඝ කිරීම සඳහා ගනු ලබන ඕනෑම ක්‍රියාමාර්ගයක් වේ. 'දිරාපත් වීම් මගින් ආරක්ෂා කිරීම සහ වෙනස් වීම් වේගයෙන් පාලනය කිරීම පිණිස ගනු ලබන ක්‍රියාමාර්ග' **(Feilden, 2008, 3)**

ලෙස ද ඇතැමුන් මෙය පෙන්වා දෙයි. මෙහි දී සළකා බැලෙනුයේ පැරණි වස්තු සම්බන්ධයෙන් නොව අති විශාල ප්‍රමාණයේ වාස්තුවිද්‍යාත්මක ඉදිකිරීම් ප්‍රවාහයක් වන ස්තූප සම්බන්ධවයි. මෙසේ ස්මාරකවල ආරක්ෂාව සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග පිළිබඳ ලෝකයේ විවිධ අවස්ථාවන් හි සාකච්ඡාවට බඳුන් වේ. 1964 වැනිසියේ දී පවත්වන්නට යෙදුන ඓතිහාසික ස්මාරක පිළිබඳ වාස්තු විද්‍යාඥයින්ගේ සහ කාර්මික ශිල්පීන්ගේ දෙවන ජාත්‍යන්තර සම්මේලනය ද එබඳුම සාකච්ඡා මණ්ඩපයක් විය. පවත්වන්නට යෙදුන ස්ථානය පදනම් කර ගනිමින් මෙය වැනිස් ප්‍රඥප්තිය ලෙස නම් කෙරුණි. අර්ථකථන, සංරක්ෂණය කිරීම, ප්‍රතිසංස්කරණය, ඓතිහාසික ස්ථාන, කැණීම්, ප්‍රකාශන යනුවෙන් ප්‍රධාන කොටස් හයකින් සහ ඒවා විස්තර කිරීමේ වගන්ති 16කින් මෙම ප්‍රඥප්තිය සමන්විත විය. මෙහි දී ලෝකයටම පොදු සම්මතයන් වශයෙන් ඉදිරිපත් කර ඇති කරුණු දේශීයව යොදා ගැනීමේ හැකියාව පිළිබඳව ද සංරක්ෂණ නිළධාරීන්ගේ අවධානය යොමු කරවයි.

මාතෘකානුගත මහා ස්තූප සම්බන්ධයෙන් මැදිහත් වීමේ දී ගන්නා ලද ක්‍රියාමාර්ගවල මෙම ප්‍රකාශ පත්‍රයේ වගන්ති ප්‍රකාරව කටයුතු කිරීම් මෙන්ම එහි නොසළකා හැරීම් ද හඳුනා ගත හැකි ය. ඉහත අභිප්‍රාය අනුව දත්ත එක්රැස් කිරීමේ දී දත්ත අත්පත් කරගැනීමේ සාර්ථකම ක්‍රමවේදය වූ ක්ෂේත්‍ර නිරීක්ෂණය යොදා ගන්නා ලද අතර, ඒ ඔස්සේ ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්ගේ අත්දැකීම් ඒකරාශී කරගැනීමට ද කටයුතු කරන ලදි. ඇතැම් පර්යේෂකයන් මෙන්ම විවිධ කාර්යයන්හි නිරත වූ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ හා මධ්‍යම සංස්කෘතික අරමුදලේ නිළධාරීන් වර්තමානයේ විශ්‍රාමික මට්ටමින් සිටිය ද සාකච්ඡා මාර්ගයෙන් ඔවුන්ගේ දීර්ඝ කාලීන ජීවන අත්දැකීමේ තුළින් ලත් දැනුම හැකි පමණික් අවශෝෂණය කරගැනීමට ද හැකියාව ලැබිණ. ක්ෂේත්‍රයෙන් හඳුනා ගන්නා ලද දත්ත ජාත්‍යන්තර වැනිස් ප්‍රකාශ පත්‍රයේ නිර්දේශ සමඟ විශ්ලේෂණය කර අත්පත් කරගන්නා ලද ප්‍රතිඵලයන් මෙහි දී ඉදිරිපත් කරඇත.

**සාකච්ඡාව**

ප්‍රඥප්තියේ පළමු වගන්තියෙන් ම පෙන්වා දෙන කාරණයක් නම්ල . . . *උසස් ගණයේ කලා නිර්මාණ පමණක් ඓතිහාසික ස්මාරක සංකල්පයට නොගත යුතු ය (The concept of a historic monument embraces not only the single architectural work but also the urban or rural setting in which is found the evidence of a particular civilization, a significant development or a historic event. This applies not only to great works of art but also to more modest works of the past which have*

*acquired cultural significance with the passing of time* - Article 1*)* යනුවෙන් වූ ප්‍රකාශනයයි. අප විසින් සාකච්ඡාවට බඳුන් කරන අභයගිරි හා ජේතවන ස්තූප උසස් ගණයේ කලා නිර්මාණ ගණයට අයත් වුව ද එසේ නොවන බොහෝ ප්‍රමාණයක් වූ සියලු පැරණි ස්මාරක සම්බන්ධයෙන් ඉහත අවධානය යොමු කිරීම ඉතා වැදගත් ය. හැරත් ස්තූපය යන්නෙන් අදහස් වන්නේ ගර්භයෙන් ඉහළ කොටස පමණක්ම නොවේ. චූඩා මාණික්‍යයේ සිට පිටත ප්‍රාකාරය දක්වාමත්, ඒ ආසන්න පරිසරයත් ස්තූපය යන්නට ඇතුළත් ය. මේ සෑම කලාපයක් පිළිබඳව ම සංරක්ෂණ මැදිහත්වීම් හමුවේ අවධානය යොමු කළ යුතුය යන්න මෙහි දී හඳුනා ගත යුතු ප්‍රධාන තත්ත්වයකි. මෙතෙක් මැදිහත්වීම්වල දී මාතෘකානුගත සියලු ස්තූපවල වැලි මළුව, පිටත ප්‍රාකාරය, ගොපුර ආදී සෙල් මළුවෙන් පිටත ශේෂයන් සම්බන්ධයෙන් අවධානය යොමු කරඇත්තේ අවම මට්ටමකිනි.

වෙනස් ප්‍රඥප්තියේ ස්මාරක සම්බන්ධයෙන් මැදිහත් වීම් පිළිබඳව පැවසීමේ දී පහත ප්‍රකාශය පෙන්වා දෙයි.*වාස්තුවිද්‍යාත්මක උරුමයන් ආරක්ෂා කිරීමට හා අධ්‍යයනය කිරීමට උපකාරී වන සියළුම විද්‍යාවන් හා ශිල්ප ක්‍රම ස්මාරක සංරක්ෂණය කිරීමේ දී හා ප්‍රතිසංස්කරණය කිරීමේ දී උපයෝගී කරගත යුතුය* (*The conservation and restoration of monuments must have recourse to all the sciences and techniques which can contribute to the study and safeguarding of the architectural heritage* - Article 2). මාතෘකානුගත ස්තූප සම්බන්ධයෙන් මැදිහත් වීමේ ඇතැම් අවස්ථාවන් හි දී මෙම තත්ත්වය සැළකිල්ලට ගෙන ඇතත්, ඇතැම් අවස්ථාවන්හි දී නොසළකා හැර ඇති බවක් ද විද්‍යාමාන වේ. විශේෂයෙන් මිරිසවැටි හා රුවන්වැලි ස්තූප සම්බන්ධයෙන් මැදිහත් වීමේ දී ඒවා පර්යේෂණමය පදනමක සිට සිදු නොකළ බැවින් මේ සම්බන්ධයෙන් අවධානයක් යොමු නොවූ බව පැහැදිලි ය. නමුත් අනෙක් ස්තූපද්වය පිළිබඳ 1980 දශකයෙන් පසු මැදිහත්වීම්වල දී ඒ වනවිට ලෝකයේ භාවිත විද්‍යාත්මක ක්‍රමවේද බහුතරයක් අන්තර්ජාතික සහයෝගයන් ඔස්සේ භාවිතයට ගෙන ඇති බව ද හඳුනා ගත හැකි ය. විශේෂයෙන් එම කටයුතු දියත් කරනවිට යුනෙස්කෝ ජාත්‍යන්තර සහයෝගය ලැබුන බැවින් ප්‍රායෝගිකව අත්හදා බලන ලද ක්‍රමශිල්ප භාවිත කර තිබේ.


වැනිස් ප්‍රඥප්තියට අනුව වාස්තුවිද්‍යාත්මක නිර්මාණයක් සම්බන්ධයෙන් සාමාන්‍ය ජනතාවගේ වැඩි අවධානයක් යොමු වන්නේ එහි කලාත්මක ආකෘතිය කෙරෙහි ය. ඒ හේතුවෙන් වෙනත් පුරාවිද්‍යාත්මක හෝ ඓතිහාසික අගයන්ට හානි සිදු වීමට ද ඉඩ තිබේ. වාස්තුවිද්‍යාත්මක උරුමයක් සතු අගයයන්, කතෘත්වයන් ආදීයෙහි පරාමිතීන් පිළිබඳ මනා වැටහීමක් ඇති කර ගත හොත් මේ

ගැටළු අවම කර ගත හැකි ය. යම් කෘතියකින් ඉදිරිපත් කරන සැබෑ අර්ථය තේරුම් ගනිමින් මිස මැදිහත් වීම් කෙරෙහි යොමු නොවිය යුතු යග එය වැනිස් ප්‍රඥප්තියෙහිල *ස්මාරක සංරක්ෂණය කිරීමේ සහ ප්‍රතිසංස්කරණය කිරීමේ අභිප්‍රාය ඒවා කලා නිර්මාණ වශයෙන් පමණක් නොව ඓතිහාසික සාධක වශයෙන් ද සුරැකීම විය යුතු ය* (*The intention in conserving and restoring monuments is to safeguard them no less as works of art than as historical evidence* - Article 3) යනුවෙන් දක්වා තිබේ. යම් ස්මාරකයක් සතු අගයන් හා ප්‍රකාශිත කතෘත්වයන් පිළිබඳ පරිනත සංවේදීතාවකින් යුතුව නිරීක්ෂණය කිරීමෙන් ඉහත අභිප්‍රාය ඉටු කරගත හැකි ය. මාතෘකානුගතව විමසීමේ දී මෙම ප්‍රකාශය මිරිසවැටිය හා රුවන්වැලිය ස්තූප සම්බන්ධයෙන් අදාළ කරගෙන නොමැති බවක් හඳුනා ගත හැකි ය. නමුත් කලාත්මක නිර්මාණ ලෙස ඉදිරිපත් කිරීම නොව, ආධ්‍යාත්මික හැඟීම් දනවන නිර්මාණ ලෙස ඉදිරිපත් කිරීම එම ස්තූප සංරක්ෂණයේ අරමුණු වී ඇත.

වෙනිස් ප්‍රඥප්තියේ සංරක්ෂණය කිරීම සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද වගන්තිවල දී සංරක්ෂණයෙන් අනතුරුව සිදු කරනු ලබන නඩත්තු වැඩපිළිවෙල සම්බන්ධයෙන් ද විස්තර කර ඇත.*ස්මාරක තහවුරු කිරීමේ දී ඒවා නඩත්තු කිරීම ද ස්ථාවර පදනමක් මත අත්‍යවශ්‍යයෙන් ම කළ යුතු ය* (*It is essential to the conservation of monuments that they be maintained on a permanent basis* - Article 4) යනුවෙන් වන ප්‍රකාශය සෑම ස්මාරකයක් සම්බන්ධයෙන්ම වැදගත් වූවකි. මාතෘකානුගත මහා ස්තූප හා අවට කලාපය සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමේ දී මෙය ක්‍රියාත්මක බව පැහැදිලි ය. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවත්, මධ්‍යම සංස්කෘතික අරමුදලත් ප්‍රධාන වශයෙන් මෙම කාර්යයන් සංවිධානාත්මක ලෙස සිදු කිරීමට උත්සාහ කරයි. කෙටි කාලීන, මධ්‍ය කාලීන හා දීර්ඝ කාලීන වශයෙන් මෙම නඩත්තු සැළසුම් ඉදිරිපත් කර ක්‍රියාත්මක කරන බව හඳුනා ගත හැකි ය. පරිපූර්ණ නඩත්තු ක්‍රියාවලියක් නොවූව ද යම් පමණකින් හෝ එම කාර්යයන් යාවත්කාලීන කරගැනීමට දරන ප්‍රයත්නයක් වර්තමානයේ දී වුව ද දෘෂ්‍යමාන වේ.

*සමාජමය වශයෙන් වැඩදායක අරමුණක පිහිටා කටයුතු කිරීමේ දී ස්මාරක සංරක්ෂණය කිරීම සෑම විටම පහසු යග එහෙත් මෙහි දී මුල් ස්වරූපය හෝ ගොඩනැගිල්ලේ අලංකාර සැරසිලි වෙනස් නොකළ යුතු යග මෙම සීමාවන් තුළ පිහිටා පමණක් යම් යම් වෙනස් කිරීම්වලට ඉඩ දිය හැකි ය* (*The conservation of monuments is always facilitated by making use of them for some socially useful purp§e. Such use is therefore desirable but it must not change the lay-out or*

*decoration of the building. It is within these limits only that modifications demanded by a change of function should be envisaged and may be permitted* - Article 5). යනුවෙන් වන සඳහන සම්බන්ධයෙන් ද මහා ස්තූප සංරක්ෂණයේ දී අවධානයට පාත්‍රව තිබේ. මෙම ස්තූප කිසිවක් පෞද්ගලික ස්මාරක නොවේ. එහෙයින් ඒවා සංරක්ෂණය කිරීමේ පරමාර්ථය හුදෙක් සමාජමය වැඩදායී අරමුණක් ම වෙයි. නමුත් ඒවායේ මුල් ස්වරූපය ආරක්ෂා කිරීම හෝ ස්මාරකයේ අලංකාර සැරසිලි ආදීය වෙනස් නොකිරීම සම්බන්ධයෙන් සැළකිලිමත් වූ බවක් ඇතැම් ස්මාරක දෙස විමර්ශනයේ දී හඳුනා ගත හැකි ය. විශේෂයෙන් රුවන්වැලිය හා මිරිසවැටිය ස්තූප සංරක්ෂණයේ දී විද්‍යාත්මක දැනුම හෝ පුරාවිද්‍යාත්මක නිර්ණායක නිසි පරිදී භාවිතයට ගැනීමක් සිදු නොකරන ලද බැවින් එම ස්මාරක දෙකින් ම ඉහත අපේක්ෂාවන් ඉටු වී නොමැති බවක් පෙන්වයි. නමුත්, සෙසු ස්මාරක ද්වය එම ලක්ෂණ ආරක්ෂා කර ගනිමින් සේම යම් යම් වෙසනස්කම් ද සිදු කරමින් සංරක්ෂණ කටයුතු දීයත් කර තිබේ. අභයගිරිය හා ජේතවනය යන ස්තූප දෙකෙහිම හතරැස් කොටුවේ මධ්‍ය චක්‍රය පැරණි ස්වරූපයෙන්ම ආරක්ෂා කර ගැනීමට කටයුතු කිරීම, ආයකවල අස්ථානගතව ඇති කොටස් වෙනුවට ගඩොල් මඟින් මැදිහත්වීම් සිදුකර සම්පූර්ණ කිරීම, පිටත ප්‍රාකාරයේ බිත්තිවල ගලින් කළ කොටස් නොමැති තැන ගඩොලින් ඌණපූර්ණයන් සිදු කිරීම ආදිය මේ අයුරින් සිදු කරන ලද මැදිහත්වීම් ලෙස පෙන්වා දිය හැකි ය.



ඡායාරූපය 1: ජේතවන ස්තූපයේ තෙවන පේසාව මත ඇති පැරණි බදාම කොටස්


වැනිස් ප්‍රඥප්තියේ 6වන වගන්තියෙහි පෙන්වා දෙන පරිදි ස්මාරක *සංරක්ෂණය කිරීම යන්නෙන් අදහස් කෙරෙන්නේ මුල් මිම් වෙනස් නොවූ පිහිටීම ආරක්ෂා කිරීමයිග යම් තැනක මුල් පිහිටීම ආරක්ෂා වී පවතී නම් එය එසේම තිබෙන්නට හැරිය යුතු යග ස්කන්ධයේ සහ වර්ණයේ සම්බන්ධතාවයට පටහැනිව යන කුමක් හෝ එක් කිරීමක් වෙනස් කිරීමක් කඩාබිඳ දැමීමක් නොකළ යුතු ය* (*The conservation of a monument implies preserving a setting which is not out of*

*scale. Wherever the traditional setting exists, it must be kept. No new construction, demolition or modification which would alter the relations of mass and colour must be allowed* - Article 6). මෙම වගන්තිය ආරක්‍ෂා කරන ලද ප්‍රධානතම අවස්ථාවක් නම්, මහා ස්තූප අතරින් අභයගිරියේ හා ජේතවනයේ දැක ගත හැකි පැරණි කපරාරු / කපලාරු *(Plaster)* කොටස් ආරක්‍ෂා කිරීමේ ප්‍රතිපත්තියයි (ඡායරූපය 1). හතරැස් කොටුව වැනි ස්ථානයන් හි දැක ගත හැකි බොරදම් ආදිය සුරක්‍ෂිත කිරීම සඳහා කටයුතු කිරීම (ඡායරූපය 2) ද තවත් උදාහරණයකි. මේවායින් ස්කන්ධයේ හෝ වර්ණයේ සමබරතාව ගිලිහී යාමක් සිදු නොවී ස්තූපවල පැරණි

අංග සුරක්‍ෂිත වීමක් බලාපොරොත්තු විය හැකි ය. *ස්මාරකය පිහිටා ඇති වටපිටාව හා එය සාක්‍ෂි දරන ඉතිහාසයට නොවෙනස්ව බැඳී පවතී. ස්මාරකයකයෙන් කොටසක් හෝ සම්පූර්ණව ඉවත් කිරීමට කිසිසේත්ම ඉඩ නොතැබිය යුතු ය. එහෙත් ස්මාරකයේ ම ආරක්‍ෂාවට එවැන්නක් අනිවාර්යයෙන් ඉල්ලා සිටින අවස්ථාවක එම ක්‍රියාවලිය ජාතිකව හෝ අන්තර්ජාතිකව මහත් සේ වැදගත් බවට සාධාරණීකරණය වුවහොත් පමණක් අනුමත කළ හැකි ය* (*A monument is inseparable from the history to which it bears witness and from the setting in which it occurs. The moving of all or part of a monument cannot be allowed except where the safeguarding of that monument demands it or where it is justified by national or international interest of paramount importance* - Article 7). මේ තත්ත්වය පැහැදිලි කිරීමේ දී ස්මාරක සම්බන්ධයෙන් මැදිහත් වීමේ මට්ටම්වල අවදානමින් වැඩිම අවස්ථාව වන නැවත ඉදිකිරීම (Reconstruction) යන තත්ත්වය හා සමාන තත්ත්වයේ පවත්නා බව පෙන්වා දිය හැකි ය. 1979 වර්ෂයේ දී සම්පූර්ණයෙන් විනාශ භාවයට පත් මිරිසවැටි ස්තූපයේ සුන්බුන් ඉවත්කර නැවත ඉදිකිරීමක් සිදු කරයි (පියතිලක බණ්ඩා, 2016: හේරත්, 2016). පැරණි කොටස්වලින් බහුතරය ඉවත් කරන්නේ ඒවා යොදා අභිමත කාර්යය සිදුකර ගැනීමේ අපහසුතා පැවති බැවිනි. රුවන්වැලි ස්තූපයේ සෙල් මළුවේ කොන් හතරෙහි පැවති කුඩා ස්තූප සියල්ලක් ඉවත්කර නැවත ඉදිකිරීමත්, අභයගිරි ස්තූපයේ ආයක නැවත ඉදිකිරීමත්, ජේතවන ස්තූපයේ ආයක හා හතරැස් කොටුව සම්පූර්ණයෙන්ම පාහේ නැවත ඉදිකිරීමත් (මණ්ඩාවල, 2009, 219) මේ තත්ත්වය කියාපායි. මේ සෑම ක්‍රියාවක්ම සිදුකර ඇත්තේ සමකාලීනව ඒ ඒ කොටස්වල දීර්ඝ කාලීන පැවැත්ම සඳහා එම කාර්යය වඩාත් හොඳ යයි පිළිගෙන ඇති බැවිනි.



ඡායාරූපය 2: ජේතවන ස්තූපයේ හතරැස් කොටුවේ සංරක්ෂණ කටයුතු




ඡායාරූපය 3: සංරක්ෂණ කාර්යයේ දී දිනගල් යෙදීම

ස්මාරකයක අඛණ්ඩ කොටස් වන කැටයම්ල චිත්‍ර හෝ අලංකාර සැරසිලි ඒවායේ ආරක්ෂාව සඳහා පමණක් නොවන්නට ඉවත් කිරීමට කිසිසේත් ඉඩ නොතැබිය යුතු ය (*Items of sculpture, painting or decoration which form an integral part of a monument may only be removed from it if this is the sole means of ensuring their preservation* - Article 8). මෙබඳු ඉවත්කිරීම් කිහිපයක්ම අභයගිරි හා ජේතවන ස්තූප ආශ්‍රයෙන් හඳුනා ගත හැකි ය. එසේ ආයකවල තිබූ සිතුවම් කොටස් සහිත සෙල් පුවරු මෙන්ම ස්ථානීයව ස්ථාපිත කළ නොහැකි වූ ආයකවල කැටයම් රූ එලක කොටස් එම ව්‍යාපෘතීන්හි කෞතුකාගාරවල ප්‍රදර්ශනයෙහි තබා ඇත. ස්මාරක සම්බන්ධයෙන් ප්‍රතිසංස්කරණ කටයුතු දියත් කිරීමේ දී එය ඉහළ

විශේෂඥ දැනුමකින් කළ යුතු වූවක් බව ද වැනිස් ප්‍රඥප්තියේ පෙන්වා දෙයි. තව ද ප්‍රතිසංස්කරණ කටයුතු දියත් කිරීමේ දී සැක කටයුතු අවස්තා එළඹෙන්නේ නම් අදාළ කාර්යය නවත්වාලිය යුතු බව ද දක්වා තිබේ.

*අත්‍යවශ්‍යයෙන් ම අතිරේක වැඩ නිම කළ යුතු විට මුල් වාස්තුවිද්‍යාත්මක ලක්ෂණවලින් වෙන්ව කැපී පෙනෙන සේ සමකාලීන මුද්‍රාවක් තැබිය යුතු ය (The process of restoration is a highly specialized operation. Its aim is to preserve and reveal the aesthetic and historic value of the monument and is based on respect for original material and authentic documents. It must stop at the point where conjecture begins, and in this case moreover any extra work which is indispensable must be distinct from the architectural comp§ition and must bear a contemporary stamp. The restoration in any case must be preceded and followed by an archaeological and historical study of the monument* - Article 9). මෙම කැපීපෙනෙන මුද්‍රාවක් තැබීම ආකාර කිහිපයකින් ම සිදු කරයි. පැරණි බිත්තියට වඩා නව බිත්තිය අඟල් බාගයක් පමණ ඇතුළට වන්නට බැඳීම, දින ගල් යෙදීම (ඡායරූප 3), නව හා පැරණි බිත්ති පැහැදිලිව වෙන් කරන කුස්තුරයක් යෙදීම (ඡායරූප 4) වැනි උපක්‍රම යොදා තිබෙනු මාතෘකානුගත මහා ස්තූප පරිශ්‍ර සියල්ලක් නිරීක්ෂණය කිරීමේ දී හඳුනා ගත හැකි අතර, ස්තූපයට අදාළ ප්‍රධාන කොටස් විස්තර කිරීමේ දී පමණක් නොව පරිබාහිර ස්මාරක සංරක්ෂණයේ දී ද එම ක්‍රමවේද යොදා ගෙන ඇති බව දැක ගත හැකි වේ.



ඡායාරූපය 4: සංරක්ෂණයේ විස්තරාත්මක දත්ත සහිත අභයගිරි ස්තූප ගර්භය

*ස්මාරකය යථාවත් කිරීමට සාම්ප්‍රදායික ශිල්පක්‍රම පමණක් නොසෑහෙන බැව් අවබෝධ වුවහොත් තහවුරු කිරීමේ දී සහ එක් කිරීමේ සඵලතාවය විද්‍යාත්මක දත්තයන්ගෙන් සහ අත්දැකීම් තුළින් ඔප්පු වී ඇති කුමන හෝ නව ශිල්පක්‍රමයක් භාවිත කළ හැකි ය* (*Where traditional techniques prove inadequate, the consolidation of a monument can be achieved by the use of any modern technique for conservation and construction, the efficacy of which has been shown by scientific data and proved by experience* - Article 10) යන නිර්දේශය ද අනුරාධපුරයේ මහා ස්තූප සම්බන්ධයෙන් මැදිහත් වීමේ දී අනුගමනය කර තිබේ. ඒ අනුව පැරණි බදාම භාවිත කළ නොහැකි බැවින් ද එය නිශ්චිත ලෙසින් හඳුනා ගැනීමට හැකි නොවූ බැවින් ද අභයගිරියේ පැරණි බදාමයට විකල්ප ලෙස නව බදාමයක් නිර්මාණය කරගැනීම සඳහා පර්යේෂණ සිදු කරන ලදි.

මෙම පර්යේෂණවල දී අවධානය යොමු වූ මූලික කරුණක් වූයේ ස්තූපයේ ගඩොල් නොගලවා තිබෙන අයුරින්ම ශක්තිමත් කළ හැකි ද යන්න අධ්‍යයනය කිරීමයි. සිමෙන්ති භාවිත නොකර විකල්ප බදාම යොදා ගැනීමට ද මෙම කමිටුව තීරණය කරන ලදී. පරීක්ෂණ සඳහා ස්තූපයේ බටහිර ආයකය අසළින් ඉහළ සිට පහළට මීටර් 1.5ක පළල තීරුවක් තෝරාගෙනමතුපිට වෘක්ෂලතා ඉවත් කොට පැරණි ගඩොල් වරි මතුවන ලෙස සෝදා පිරිසිදු කරන ලද්දේ ඉහළින් සවි කරන ලද ජල ටැංකියකින් පීඩනය ඔස්සේ ලැබෙන ජලය මාර්ගයෙනි. එසේ කුස්තුර ශුද්ධ කොට සිමෙන්ති භාවිත නොකර හුණු හා ගඩොල් කුඩු 1:1 අනුපාතයෙන් යොදා සකස් කර ගත් දියර බදාම නළයකින් විදීමක් මගින් (ඡායාරූපය 5) දුර්වල වී ඇති බදාම ශක්තිමත් කිරීමට උත්සාහයක් දැරීය (කුලතුංග, 2014, 106). නමුත් අවස්ථා දෙකක දී සිදු කරනු ලැබූ පර්යේෂණ අවසානයේ කරුණු කිහිපයක් හේතුවෙන් එම ක්‍රමය අසාර්ථක බව තහවුරු විය.

- ගඩොල් අතර කුස්තුර පිරිසිදු කිරීමේ දී ඩ්‍රිල් කටු ආධාරයෙන් සිදුරු කිරීමට සිදු වීමෙන් බොහොමයක් ගඩොල්වල මුහුණත පලුදු වීම, බන්ධනය දුර්වල වීම හා ඉරිතැලීම් සිදු වීමෙන් ස්තූපයේ ශක්තිය සඳහා සෘජු බලපෑම් ඇති කිරීම
- කුස්තුර තුළට පූර්ණ වශයෙන් බදාම නොයාම
- විදින ලද බදාම පිටතට පැමිණ ගර්භයේ ලප ඇතිවීම
- දියර වශයෙන් විදිනු ලැබූ බදාම වියළීමෙන් පසු හිස් අවකාශ ඇති වීම
- ගඩොල් වරි හා කුස්තුර හොඳින් රැකී ඇති ස්ථානවලට පමණක් මෙය ක්‍රියාත්මක කළ හැකි වීම

- පීඩනයකින් යුතුව ජලය යෙදීමේ දී මතුපිට පවත්නා ගඩොල් ගඩොල් දුර්වල වීම
- බදාම වියළී ගිය විට බදාමය තුළ පිපිරුම් සළකුණු දක්නට ලැබීම
- ස්තූපයේ අභ්‍යන්තරයට ගොස් ඇති මුල් ආදිය ඉවත් කිරීමට යාමෙන් ගඩොල් පදාස වශයෙන් ඉවත් කිරීමට සිදු වන බැවින් එබඳු ස්ථානවලට මේ ක්‍රමට යෝග්‍ය නොවීම, යනා දී තත්ත්වයන් මෙහි දී ප්‍රධාන වශයෙන් කැපී පෙනෙන්නට විය (එම., 107; ගොඩකුඹුර, 1997, 33-34). එසේ මුල් ක්‍රමය අසාර්ථක වීමත් සමග තවත් ක්‍රමයක් භාවිත කිරීම පිළිබඳව විද්වතුන්ගේ අවධානය යොමු වීමෙන් දෙවන අත්හදා බැලීම ක්‍රියාත්මක කරන්නට විය. එනම් බුරුල් වූ ගඩොල් ගලවා පහත සිට ඉහළට බදාම යොදා පැරණි ගඩොල් බැඳීම සිදු කිරීමයි. මෙහි දී නිශ්චිත පරිමාණවලින් එක් කර ගන්නා ද්‍රව්‍ය පහත පරිදී මිශ්‍රණය කර ගැනීමෙන් විශේෂ බදාමයක් පිළියෙල කරගෙන තිබේ. හුණු ග්‍රෑම් 30, හුඹස් මැටි ග්‍රෑම් 60, දහයියා පුළුස්සන ලද අළු ග්‍රෑම් 30, පිටි කරන ලද රට උළු කුඩු ග්‍රෑම් 60ක් ජලය මිලිලීටර් 65ක දීය කිරීමෙන් ලැබෙන මිශ්‍රණය බදාම වශයෙන් යොදා ගෙන මෙම ගඩොල් බැඳීම සඳහා භාවිතයට ගෙන තිබේ. මෙය පෙර ක්‍රමවේදයට වඩා සාර්ථක බැව් නිශ්චය කර ගන්නට වූයෙන් ස්තූප සංරක්ෂණය සඳහා යොදා ගැනීමට තීරණය විය. නමුත් පිටත බිත්ති සඳහා ඉහත ක්‍රමය භාවිත කලත්, 2011 වර්ෂයේ සිට ගර්භය අභ්‍යන්තරයේ බැඳීම් කටයුතු සඳහා හුණු හා වැලි පමණක් මිශ්‍ර කර ගත් මිශ්‍රණයක් යොදාගෙන තිබේ (කුලතුංග, 2014, 107; කුලතුංග, 2015, 28-29).

නමුත්, ජේතවන ස්තූපය සම්බන්ධයෙන් කටයුතු කිරීමේ දී තත්ත්වය තරමක් වෙනස් වූ අතර, පැරණි බදාම වෙනුවට දිගින් දිගටම පෝට්ලන්ඩ් සිමෙන්ති භාවිතකරනු හඳුනා ගත හැකි විය. සාම්ප්‍රදායික ශිල්ප ක්‍රම ප්‍රමාණවත් නොවන අවස්ථාවන්හි හා සාම්ප්‍රදායික ක්‍රම හඳුනා ගත නොහැකි අවස්ථාවන් හි මෙබඳු පර්යේෂණ මගින් ප්‍රතිඵල විශ්ලේෂණය වඩාත් හිතකර වුවත්, ඒවා දිගින් දිගටම අදාළ ස්මාරකය සඳහා බලපාන ආකාරය ද පර්යේෂණයට බඳුන් කළ යුතු වේ. නමුත් සෑහීමට පත් විය හැකි කරුණ නම් මේ දෙයාකාර වූ මැදිහත්වීම් අභයගිරි හා ජේතවන ස්තූප සම්බන්ධයෙන් සිදු කරන්නේ සමස්ත නිර්මාණය සඳහා ම නොව පිටත වැස්ම සඳහා පමණක් වීමයි. මේවා ඕනෑම අවස්ථාවක දී ඉවත් කිරීමට හැකි පදනමක පිහිටා සිදු කරනු ලබයි. කෙසේ නමුදු රුවන්වැලි ස්තූපය හා මිරිසවැටි ස්තූපය සම්බන්ධ මැදිහත්වීම්වල දී පූර්ව අත්හදා බැලීම් කිසිවකින් තොරව අදාළ කටයුතු සිදුකර ඇති බව ද පැහැදිලිය.


*ස්මාරකවල සෑම කාලපරිච්ඡේදයක් පිළිබඳවම පිළිබිඹු කරන පිළිගත හැකි සාධක සියල්ලම ආරක්‍ෂා කර ගත යුතු ය (The valid contributions of all periods to the building of a monument must be respected, since unity of style is not the aim of a restoration. When a building includes the superimp§ed work of different periods, the revealing of the underlying state can only be justified in exceptional circumstances and when what is removed is of little interest and the material which is brought to light is of great historical, archaeological or aesthetic value, and its state of preservation good enough to justify the action. Evaluation of the importance of the elements involved and the decision as to what may be destroyed cannot rest solely on the individual in charge of the work* - Article 11) යනුවෙන් ද වෙනිස් ප්‍රඥප්තියේ දක්වයි. මාතෘකානුගත මහා ස්තූපයන් හි මිරිසවැටිය හා රුවන්වැලිය සම්බන්ධයෙන් මෙබඳු තත්ත්වයන් ආරක්‍ෂා කිරීම සම්බන්ධයෙන් තොරතුරු ලැබෙන්නේ අල්ප වශයෙනි. නමුත්, අභයගිරිය හා ජේතවනය ස්තූප සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමේ දී සාහිත්‍ය මූලාශ්‍රයන් හි විස්තර කරන යම් යම් අවධි ස්තූප ආශ්‍රයෙන් ද හඳුනා ගත හැකිව තිබේ. එම අවධිවලින් වැඩි ප්‍රමාණයක් සංරක්‍ෂණ මැදිහත් වීම් හමුවේ ඉදිරිපත් කරන්නට ද කටයුතු යොදා ඇත. මෑත කාලීන මැදිහත්වීම් සියල්ලක් වුව ද නැවත පෙර පැවති තත්ත්වයට හැරවිය හැකි මට්ටමින් සංරක්‍ෂණය කර ඇති බැවින්, වර්තමානයේ මැදිහත්වීම් වැරදි යයි හඳුනා ගන්නා කවර කලෙක වුව ද නිසි මැදිහත්වීමක් කරා යාමට



ඡායාරූපය 5: රෝලන්ඩ් සිල්වා විසින් කුස්තුර තුළට බදාම විදීමේ ක්‍රමය අත්හදා බලමින්
(ඡායාරූපයඃ මායා උපනන්ද, මධ්‍යම සංස්කෘතික අරමුදල)

අභයගිරි හා ජේතවන ස්තූපවලට හැකියාව ඇත.

ස්මාරක සංරක්ෂණයේ දී අවධානය යොමු කරන තවත් ක්ෂේත්‍රයක් නම්, ආදේශක එකතු කිරීමේ නිර්ණායකයි. *ආදේශක එකතු කිරීමේ දී ඒවා ස්කන්ධයට මනාව ගැලපිය යුතු යග නව හා පැරණි කොටස් වෙන් කොට හඳුනා ගැනීමේ හැකියාව ද පැවතිය යුතු වේග මෙ ප්‍රතිසංස්කරණ මගින් ස්මාරකයේ ඓතිහාසික හෝ කලාත්මක සාධක කිසි විටෙකත් ව්‍යාජව පෙන්වුම් නොකළ යුතු ය (Replacements of missing parts must integrate harmoniously with the whole, but at the same time must be distinguishable from the original so that restoration does not falsify the artistic or historic evidence* - Article 12) යන්නයි. මාතෘකානුගත ස්තූප සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමේ දී ගඩොල් බිත්ති බැඳීමේ දී නව ගඩොල් භාවිතයත්, ශිලාමය කොටස් වෙනුවට බදාමයෙන් තනන ලද ආකෘති ඉදිරිපත්



ඡායාරූපය 6: ගඩොල්වලින් ඌණ පූර්ණය කරන ලද ජේතවනයේ ශිලාමය ප්‍රාකාරයක්



ඡායාරූපය 7: සිමෙන්ති බදාම භාවිතයෙන් ඌණ පූර්ණය කරන ලද ශිලාමය ප්‍රාකාරයක්

කිරීමත්, ඉහත කරුණු සනාථ කිරීමෙහි මූලාශ්‍ර සපයයි (ඡායරූප 6 - 7).

වෙනස් ප්‍රඥප්තියෙහි පෙන්වා දෙන, *වැදගත් කොටස් නොවැදගත් සේ පෙනෙන පරිදි හෝ ස්මාරකයේ සාම්ප්‍රදායානුකූල පෙනුමට හානිවන හෝ එහි සංයුතියේ තුලනයට බලපාන හෝ එය පිහිටි වටපිටාවට අයෝග්‍ය වන හෝ කිසිම එකතු කිරීමකට ඉඩ නොතැබිය යුතු ය(Additions cannot be allowed except in so far as they do not detract from the interesting parts of the building, its traditional setting, the balance of its comp§ition and its relation with its surroundings* - Article 13) යනුවෙන් වන ප්‍රකාශය ද ප්‍රස්තුත ස්තූප සම්බන්ධයෙන් විමසීමේ දී වැදගත් වේ. ජේතවනයේ හා අභයගිරියේ ස්තූපවල සාම්ප්‍රදායානුකූල පෙනුමට හානි සිදු නොකර ඇති නමුත්, මිරිසවැටියේ හා රුවන්වැලියේ ස්තූප සම්බන්ධයෙන් ආකල්පය තරමක් වෙනස් ය. පුරාවිද්‍යාත්මක නිර්ණායක ඔස්සේ කටයුතු නොකිරීම හේතුවෙන් එම ස්තූපවල වැදගත් ලක්‍ෂණ යටපත් වී ඓතිහාසික අගය වෙනුවට නව ඉදිකිරීමක පෙනුමක් ලබා දී ඇත. දේශපාලනය, ජාතිකත්වය පිළිබඳ හැඟීම ආදී තත්ත්වයන් යටතේ සංරක්‍ෂණ මැදිහත්වීම් සිදු කිරීමට යාමෙන් මෙවන් අහිතකර තත්ත්ව උදා වී ඇත.

**සමාලෝචනය හා නිගමනය**

අනුරාධපුරයේ මහා ස්තූප සංරක්‍ෂණය කිරීමේ දී අනුගමනය කරන ලද ක්‍රමවේද ජාත්‍යන්තර මට්ටමින් ඉදිරිපත් කරන ලද වෙනිස් ප්‍රඥප්තියේ පෙන්වා දී ඇති නිර්ණායක හා ගැලපීමේ දී ඒවා එකිනෙකක් සමානුපාතික වන බව ද, බොහෝ නිර්ණායක පිළිබඳව සැළකිලිමත්ව ඇති බව ද හඳුනා ගත හැකි ය. විශේෂයෙන් මේ සම්මත ඉදිරිපත් කිරීම් අතරින් බොහොමයක් විද්‍යමාන වන්නේ ජේතවන හා අභයගිරි ස්තූප සම්බන්ධයෙන් පමණි. මිරිසවැටිය හා රුවන්වැලිය ස්තූප සම්බන්ධයෙන් මැදිහත්වීම් සිදු කරන කාලසීමාව වන විට ජාත්‍යන්තර තබා ජාතික පුරාවිද්‍යාත්මක නිර්ණායක හෝ සැළකිල්ලට භාජනය වී නොමැත. එබඳු මැදිහත්වීම් අවසානයේ පුරාවිද්‍යාත්මක වැදගත්කම් ආරක්‍ෂා වීමක් බලාපොරොත්තු වීමට ද හැකියාවක් නොවේ. ජාතික වශයෙන් මධ්‍යම සංස්කෘතික අරමුදල හා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව යන ආයතන දෙකෙහිම සහයෝගයත්, ජාත්‍යන්තර වශයෙන් යුනෙස්කෝ, අයිකොමස් වැනි ආයතනයන් හි සහයෝගයත් සමගින් පුරාවිද්‍යාත්මක සංරක්‍ෂණ දියත් කරන ලද ජේතවන හා අභයගිරි ව්‍යාපෘතීන්හි කටයුතු හමුවේ ජාත්‍යන්තර වෙනිස් ප්‍රඥප්තියේ බොහෝ වගන්ති භාවිත තලයේ ක්‍රියාත්මක වූ බව පෙන්වා දිය හැකි ය.

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**


කුලතුංගල ටී.ජී. (2014), *පුරාණ අභයගිරි විහාරය*, මධ්‍යම සංස්කෘතික අරමුදල , කොළඹ 7.

කුලතුංග, ටී.ජී. (2015), අභයගිරි දැගැබ් පුරාණය, *අභයගිරි ස්තූප පූජා*, ප්‍රශාන්ත ගුණවර්ධන ඇතුළු පිරිස, සංස්. මධ්‍යම සංස්කෘතික අරමුදල , 22-29 පිටු.

ගොඩකුඹුරල රංජිත්, (1997), අභයගිරි ස්තූප ගර්භ සංරක්ෂණය, සංස්කෘතික පුරාණය, 2 වෙළුම, 5 කලාපය, ටී.ජී. කුලතුංග, සංස්. මධ්‍යම සංස්කෘතික අරමුදල, 31-35 පිටු.

පියතිලක බණ්ඩා, ඩී.එම්. (2016), *මිරිසවැටි ස්තූපයේ සංරක්ෂණ මැදිහත්වීම් මට්ටම්*, සාකච්ඡා කරන ලද්දේ, විජේපාලල ඩබ්.එම්.ටී.බී. (සම්මුඛ) 2016 පෙබරවාරි 14

මලල්පොල, යමුනා (2009), බ්‍රිතාන්‍ය යුගයේ සිට 1982 දක්වා ජේතවන ස්තූපය හා සම්බන්ධ මැදිහත්වීම් සහ ක්‍රියාකාරකම්, *ජේතවන ස්තූප පුරාණය*, සමරු කලාපයල (සංස්.) පී.බී. මණ්ඩාවල, ප්‍රකාශන අංශය, මධ්‍යම සංස්කෘතික අරමුදල , නිදහස් මාවත, අතපත්තු ගොඩනැගිල්ලල කොළඹ 7. 199-206 පිටු

Feilden, Bernard M. (1994). *Conservation of Historic Buildings.* Butterworth-Heinemann Ltd, Oxford.

*Venice Charter* (1964) [Online]. Available from: http://www.iflaclc.org/guidance/ICOM§-VeniceCharter-1964.pdf [Accessed February 20, 2016].